ෆෙයාෆස්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්
(සමාගම් අංකය: PB5180)
ඇක්සස් ටවර්ස් **II** (14 වන මහල),
නො. 278/4, යුනියන් පෙදෙස, කොළඹ 02,
ශ්‍රී ලංකාව.
දුරකථන:+94 11 2428428 | ෆැක්ස්:+94 11 2438438
විද්‍යුත් තැපෑල (Email): info@fairfirst.lk |
වෙබ් අඩවිය: www.fairfirst.lk

රක්ෂණ නිෂ්පාදන තොරතුරු ලේඛනය (IPID)

නෞකා කද සඳහා වන **රක්ෂණ ආවරණය** (Marine Hull Insurance cover)

මෙම ලේඛනය මඟින් ඔබේ රක්ෂණ ඔප්පුව පිළිබඳ කෙටි සාරාංශයක් සපයයි. සම්පූර්ණ විස්තර සඳහා කරුණාකර සම්පූර්ණ රක්ෂණ ඔප්පු ලේඛනය (Policy Document) සහ උපලේඛනය (Schedule) බලන්න. කිසියම් පරස්පරතාවයක් ඇති වුවහොත්, රක්ෂණ ඔප්පු ලේඛනයේ සඳහන් කරුණු බලාත්මක වේ.

1. රක්ෂණ ආවරණ වර්ගය (Type of insurance cover)

නෞකා කද සඳහා වන රක්ෂණ ආවරණය (Marine Hull Insurance cover) සැලසුම් කර ඇත්තේ, රක්ෂණ උපලේඛනයේ, වගන්තිවල හෝ මිල ගණන් කැඳවීමේ (quotation) සඳහන් කර ඇති අවදානම් හේතුවෙන් ඔබගේ නෞකාවට (නෞකා කද, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ) සිදුවන භෞතික හානිය හෝ අලාභහානිය ආවරණය කිරීම සඳහා ය.

2. **ආවරණයේ ප්‍රධාන ප්‍රතිලාභ - ආවරණය වන කරුණු (Key Benefits of the Cover)**

ඔබගේ රක්ෂණ උපලේඛනය, වගන්ති හෝ මිල ගණන් කැඳවීමේ දැක්වෙන අඩු කිරීම්වලට (deductible) යටත්ව, රක්ෂිත මුදල (Sum Insured) දක්වා වූ පුළුල් පරාසයක සාගර අවදානම්වලින් මෙම රක්ෂණ ඔප්පුව මඟින් ඔබගේ නෞකාව ආරක්ෂා කරයි.

2.1 නෞකාවට (නෞකා කඳට) සිදුවන අලාභහානි:

ඔබගේ රක්ෂණ උපලේඛනය, වගන්ති හෝ මිල ගණන් කැඳවීමේ නියම කර ඇති අවදානම් හේතුවෙන් ඔබගේ නෞකාවට සිදුවන භෞතික හානි හෝ අලාභයන් අප විසින් ආවරණය කරනු ලැබේ. මුහුදු, ගංගා, විල් හෝ වෙනත් නාවික ජල මාර්ගවල සිදුවන ආපදා, ගින්න හෝ පිපිරීම් මෙයින් කිහිපයකි.

3. **අතිරේක ප්‍රතිලාභ (අනුමත කිරීම්) හෝ ව්‍යාප්ත කිරීම් (Additional Benefits / Extensions)**

3.1 ඔබගේ අවශ්‍යතාවය අනුව, අමතර වාරිකයක් යටතේ, සාමාන්‍යයෙන් බැහැර කර ඇති යුද්ධ සහ වැඩවර්ජන වැනි අවදානම් ආවරණය වන පරිදි ඔබගේ රක්ෂණ ඔප්පුව ව්‍යාප්ත කර ගත හැක.

3.2 අමතර වාරිකයක් ගෙවා, මඟීන් සහ කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙනුවෙන් වන වගකීම් (Liability) ආවරණය කර ගත හැක.

3.3 අමතර චාරිකයක් ගෙවා, නෞකාව ධාවනය කිරීමේදී තෙවන පාර්ශවයකගේ දේපළවලට සිදුවන හානි සහ ශාරීරික හානි සම්බන්ධයෙන් ඇතිවන වගකීම් ආවරණය කර ගත හැක.

4. ප්‍රධාන බැහැර කිරීම් - ආවරණය නොවන කරුණු (Key Exclusions)

4.1 **ප්‍රධාන බැහැර කිරීම්** (Paramount Exclusions): පහත සඳහන් කරුණු හේතුවෙන් සිදුවන අලාභහානි හෝ වගකීම් මෙම රක්ෂණ ඔප්පුව මඟින් සම්පූර්ණයෙන්ම බැහැර කරනු ලැබේ:

- යුද්ධය, සිවිල් යුද්ධය සහ වෙනත් සටන්කාමී ක්‍රියා.
- වැඩවර්ජන, වැඩ වැසීම් (lock-outs), කැරලි, සිවිල් ජනතාවගේ නොසන්සුන්තාවයන් සහ ත්‍රස්තවාදී ක්‍රියා.
- පුපුරන සුලු ද්‍රව්‍ය හෝ යුධ ආයුධ භාවිතයෙන් කරනු ලබන ද්වේෂසහගත ක්‍රියා.
- න්‍යෂ්ටික අවදානම් සහ විකිරණශීලී දූෂණය.

4.2 අනෙකුත් වැදගත් බැහැර කිරීම් (Other important Exclusions):

- ඔබගේ නෞකාවේ සුන්බුන් ඉවත් කිරීම (Removal of wreck).
- සාමාන්‍ය ගෙවී යාම හෝ අයිතිකරු/කළමනාකරු ලෙස ඔබ විසින් දක්වන නිසි සැලකිල්ල/ප්‍රවේශම (due diligence) නොමැතිකම හේතුවෙන් සිදුවන හානි.

සටහන: බැහැර කිරීම්වල සම්පූර්ණ ලැයිස්තුව සඳහා ඔබගේ රක්ෂණ උපලේඛනය (Policy Schedule), වගන්ති හෝ මිල ගණන් කැඳවීම පරිශීලනය කළ යුතුය.

5. චාරික ගෙවීමේ ක්‍රමය

ඔබගේ රක්ෂණ චාරිකය සමස්ත රක්ෂණ කාලසීමාව සඳහාම (සාමාන්‍යයෙන් වසරක් වන) වාර්ෂික චාරිකයක් ලෙස ගෙවනු ලැබේ.

6. වැදගත් සිද්ධිමය තොරතුරු හෙළිදරව් කිරීමේදී රක්ෂණ ඔප්පුහිමියාගේ වගකීම් (Obligations in disclosing material facts)

මිල ගණන් ලබා ගැනීමේදී, රක්ෂණ ගිවිසුමකට එළඹීමේදී සහ රක්ෂණ කාලසීමාව තුළදී සියලුම වැදගත් සිද්ධිමය තොරතුරු (material facts) පූර්ණ ලෙස සහ අවංකව රක්ෂකයා වෙත හෙළිදරව් කිරීම රක්ෂිතයාගේ, ඔහුගේ නියෝජිතයාගේ හෝ රක්ෂණ තැරැව්කරුගේ වගකීම වේ.

නාවික යෝග්‍යතාවය පවත්වා ගැනීම (Maintain Seaworthiness): ඔබගේ නෞකාව නිසි ලෙස නඩත්තු කර ඇති බවටත්, සෑම විටම නාවික යෝග්‍යතාවයෙන් (seaworthy condition) පවතින බවටත් තහවුරු කර ගැනීමට ඔබ සියලු සාධාරණ පියවර ගත යුතුය.

7. **හිමිකම්පෑමක් (Claim) කිරීමේදී රක්ෂණ ඔප්පුහිමියාගේ වගකීම්**

7.1 **අලාභය අවම කිරීමේ වගකීම** : යම් සිදුවීමක් වූ විට, "ප්‍රවේශම්කාරී අරක්ෂිත පුද්ගලයෙකු" (prudent uninsured) ලෙස කටයුතු කිරීමේ වගකීමක් ඔබට ඇත. එනම් අලාභය වැළැක්වීම හෝ අවම කිරීම සඳහා ඔබ සියලු සාධාරණ පියවර ගත යුතුය.

7.2 වන්දිය නැවත අය කර ගැනීමේ අයිතිය ආරක්ෂා කර ගැනීම සඳහා, වගකිවයුතු තෙවන පාර්ශවයන්ට එරෙහිව (උදා: තෙවන පාර්ශවයේ නෞකාවට එරෙහිව) වහාම හිමිකම්පෑමක් ගොනු කළ යුතුය.

8. **හිමිකම්පෑමකදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය**

1 වන පියවර : **අප වෙත වහාම දැනුම්දීම**

අනතුරක් හෝ හානියක් පිළිබඳව ඔබට දැනගැනීමට ලැබුණු වහාම අප වෙත දැනුම් දිය යුතුය. එමඟින් පරීක්ෂකවරයෙකු (surveyor) පත් කිරීමට අපට අවස්ථාව ලැබේ.

2 වන පියවර : **පරීක්ෂණ සහ අලුත්වැඩියාවන් සඳහා සහයෝගය දැක්වීම** (Cooperate with Survey and Repairs)

අලුත්වැඩියාවන් සිදු කළ යුතු වරාය තීරණය කිරීමට සහ අලුත්වැඩියා කරන ආයතනය අනුමත කිරීමට අපට අයිතිය ඇත. රක්ෂකයා අනුමත කරන තෙක් අලුත්වැඩියා කටයුතු ආරම්භ නොකළ යුතුය. මෙම ක්‍රියාවලිය සඳහා ඔබ පූර්ණ සහයෝගය ලබා දිය යුතුය.

9. **පැමිණිලි සහ දුක්ගැනවිලි හැසිරවීම** (Complaints and Grievance Handling)

පියවර 1 - ෆෙයාර්ෆස්ට් ඉන්ෂුවරන්ස් (Fairfirst Insurance) අමතන්න:

☎ +94 11 2428282 (පෙ.ව. 8:30 සිට ප.ව. 5:00 දක්වා) | ✉ info@fairfirst.lk

ඔබට පවතින ගැටලු ෆෙයාර්ෆස්ට් හි අවදානම් සහ අනුකූලතා (Risk & Compliance) කණ්ඩායම වෙත යොමු කල හැකිය.

පියවර 2 - බාහිර පාර්ශවයන් වෙත යොමු කිරීම (ගැටලුව විසඳී නොමැති නම්):

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL)

☎ +94 11 2335167 | ✉ info@ircsl.gov.lk | 🌐 www.ircsl.gov.lk

රක්ෂණ ඔම්බුඩ්ස්මන් (Insurance Ombudsman)

☎ +94 11 2505542 / +94 11 2505041 |

✉ info@insuranceombudsman.lk | 🌐 www.insuranceombudsman.lk

10. **වැඩි විස්තර සඳහා අප අමතන්න** (Contact us for more information)

ෆෙයාර්ෆස්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් (Fairfirst Insurance Limited)

ඇක්සස් ටවර්ස් II (14 වන මහල), අංක 278/4, යූනියන් පෙදෙස, කොළඹ 02, ශ්‍රී ලංකාව.

☎ +94 11 2428428 | ✉ info@fairfirst.lk | www.fairfirst.lk

11. **වෙනත් යම් තොරතුරක් (Any other information)**

11.1 **කපාහැරීමේ මුදල** (Deductible):

සෑම හිමිකම්පෑමක් සඳහාම කපාහැරීමේ මුදලක් (Deductible) බලපැවැත්වෙන අතර, එය ඔබ විසින් පළමුව ගෙවිය යුතු මුදල වේ. මෙම මුදල ඔබගේ රක්ෂණ උපලේඛනයේ (Policy Schedule) දක්වා ඇත.

11.2 **ඌන රක්ෂණය** (Under insurance):

ඔබගේ නෞකාව ඌන රක්ෂණය කර ඇත්නම් (වටිනාකමට වඩා අඩුවෙන් රක්ෂණය කර ඇත්නම්), අර්ධ හානි, ගොඩගැනීමේ පිරිවැය (salvage), පොදු සාමාන්‍ය අලාභයන් (general average) සහ අලාභ අවම කිරීමේ හා ශ්‍රම පිරිවැය (sue and labour expenses) වෙනුවෙන් කරනු ලබන හිමිකම්පෑම් ගෙවීම් සමානුපාතිකව අඩු කරනු ලැබිය හැක.

සටහන: "මෙම IPID (රක්ෂණ නිෂ්පාදන තොරතුරු ලේඛනය) මඟින් ප්‍රධාන ආවරණය සහ අදාළ නම් අතිරේක ආවරණ මෙන්ම රක්ෂණ ඔප්පුවේ ප්‍රධාන ලක්ෂණ පිළිබඳ සාරාංශයක් සැපයීමට අදහස් කරන අතර, එය ඔබේ නිශ්චිත පුද්ගලික අවශ්‍යතාවලට අනුව සකස් කරන ලද්දක් නොවේ. නිෂ්පාදනයේ සම්පූර්ණ සහ පුද්ගලීකරණය කළ තොරතුරු මෙන්ම බැහැර කිරීම් ඇතුළත් පූර්ව-ගිවිසුම්ගත සහ ගිවිසුම්ගත සම්පූර්ණ කොන්දේසි ඔබේ රක්ෂණ ඔප්පු ලේඛනයේ (policy document) දක්වා ඇත. මෙම IPID ලේඛනය රක්ෂණ ඔප්පුවේ/ගිවිසුමෙහි කොටසක් ලෙස නොසැලකේ. එබැවින්, කිසියම් පරස්පරතාවයක් ඇති වුවහොත් රක්ෂණ ඔප්පු ලේඛනයේ සඳහන් නියමයන් සහ කොන්දේසි බලාත්මක වේ."

****මෙම ලේඛනය සාමාන්‍ය අවබෝධය සඳහා පමණක් සරල ආකෘතියකින් සකස් කර ඇත. කිසියම් පැහැදිලි කිරීමක්, අර්ථ නිරූපණයක් හෝ විෂමතාවක් (විශේෂත්වයක්/පරස්පරයක්) මතු වුවහොත්, නිල ඉංග්‍රීසි රක්ෂණ ඔප්පු පාඨය බලපැවැත්වෙන අතර, සම්පූර්ණ නියමයන්, කොන්දේසි, බැහැර කිරීම් සහ ආවරණ විස්තර සඳහා සැමවිටම එය පරිශීලනය කළ යුතුය.**